# බුදුගුණ අලංකාරය

වීදාගම හිමියන් විසින් රචිත බුදුගුණ අලංකාරය

1. කුළුණු මෙත් සත වෙත
පතළ නැණ සවපද රුත
හෙළ කළ ලොවට සෙත
නිතර නමදිමු මුනිඳු සරණත

2. ලංකර සසර හිම්
දුරුකර කෙලස් බිය ගිම්
සිඳු කළ යුතු උතුම්
වදිම් නව ලොව් තුරා සදහම්

3. කිසි කෙනෙකුන් පමණ
නොකැළැකි තුණැති අපමණ
සතහට පිළිසරණ
වදිම් අදරින් අරී සඟ ගණ

4. බව සිඳු පසු රුවන්
අව බිය අඳුරු හි රුවන්
පිරි ගුණ මහ රුවන්
මෙසේ නමකර පුදා තෙරුවන්

5. කයනම් අසාරය
බව නම් බයන් කාරය
කියනුය දිවා රැය
කියම් බුදු ගුණ අලංකාරය

6. මහ කවි වරන් පෙර
පවසා නොපත් පරතෙර
සුගතිඳු ගුණ ගැඹර
මේමා කියමි සිතනු වැරසැර

7. සුවාසූ දහසක්
යොදුන් ගැඹුර'ති මුහුදක්
ගොඩ කරමැයි උදක්
ලෙහෙනු කළ තැන් වැන්න දවසක්

8. එතකුදු වත් සොඳින්
පුරමී පිණක් නොමදින්
මුනිදු ගුණ මුහුඳින්
බිදක් දක්වමි උදක් ඔකඳින්

9. නුවණැති යෙනි මෙමා
බස දෙස ඇතත් එදමා
දෙසවන් පුටනමා
පමා නොව ගනුව මුනි ගුණමා

**විසල් පුර වැනුම්**

10. සඟ සිරි අසාලා
කළයුරු සොඳුරු සාලා
සිරින් සුවිසා ලා
පවර නුවරෙක් වී විසාලා

11. සත් සමුදුර අගළ
සත්ගිරි පවුරු වට කළ
සක් පුර මිස උදුළ
එපුර සරි කොද පුරෙක් සක්වළ

12. බබළන පැහැ ගිහිණි
වෙන වෙන දෙසින් සපැමිණි
පබළු රන්මුතු මිණි
නොයෙක් සල්පිල් සියෙන් සුසැදිණි

13. ගණ රන් කොත් පැළැඳි
බිතුසිතුවමින් සිත් පැඳි
මිණි පහ පැහැ විහිදි
කොවේ මාවේ සියෙන් සිය සැඳි

14. පුර වැසියන් තිළි
කෙළින කෙළි මෙන් නියැළි
දද ඉන් ඉන් වෙළි
කෙළි පුරඹර රැසින් බැබළි

15. මනහර රුසිරි සර
දෙවියන් ලෙසින් සුර පුර
උරයෙන් උර පැහැර
නිතොර මහසෙන් සිටිති එනුවර

16. හෙන සෙන සේ කිපෙන
තවසුන් ලෙසින් හික් මෙන
හැම රුපුසෙන් දිනන
මහත් ගජසෙන් සිටිති තැන තැන

17. හසල පස් දහරේ
කිසි දෙස් නොමැති සිරුරේ
යනෙන නිති එ පුරේ
තුරඟ සෙන් වැනි තරඟ සයුරේ

18. එ පුර රජ මහවත
බන් රන් දෙනෙත් පැහැපත
සක් සන් ගත් දිගත
නිතර රන සෙන් විතර වනු නැත

19. සුරතුරු මෙන් කැමැති
දෙය යදියන්ට දෙන නිති
ලොවැ පරසිඳු පිනැති
නොයෙක් මහසල් කුලන්ගෙන්යුති

20. සුරඟන සිරි'සිලු
වරඟන කෙළින සඳ ලු
ලිය ගී කන් කලු
ඉමෙක් තැන රඟන රඟම්ඩුලු

21. ඇම තැන ඇති සැපත්
එකතැන් කළෙව් සිරිගත්
දැක දැක රිසි නුමුත්
නැතැයි යන සම්පතෙක් එහි නැත්

22. නන් වෙස් නන් බරණ
සැපතින් පිරුණු අපමණ
සිටි වයසෙහි තුරුණ
කෙසේ මෙතෙකැයි යෙද්ද නරගණ

23. සිහිල් දිය පිරුණු
පිය ගැට පෙළින් දිලුණු
බිඟු දැල් විසුරුණු
වූය තැන තැන පියුම් පොකුණු

24. නළඹල නන් කෙහෙලි
බන් මිණි කිකිණි මුතුලැලි
රන් වැට පහන් දිලි
දෙරින් දෙර දන් දෙවන දන් හල

25. අසුර සෙන් තරමින්
තැන තැන පැන අතර මින්
රුපු මන් උපුර මින්
සරණ මහ සෙනඟ අවි සරමින්

26. ගිජිඳුන් තිමද ගිලි
තුරඟුන් සමග නොහැකිලි
තබා බන් රනැකිලි
කෙළින තැන් තැන්හි ගිලි අලියකුලි

27. දැනගෙණ විදු සියල්
උනු'නට වෙමින් පිළිම ල්
කියන රැ දහව ල්
සැදිනි වෙන වෙන නොයෙක් විදුහල්

28. විහිදි මිණි කිරණය
දෙර දෙරෙහි රන් තොරණය
නිති සතොස කරණය
සිරින් පිරි තිරි එපුර දෙරණය

29. සතුරන් කළ නිහඬ
එහි රිය සක් හිසක් හඬ
වැජඹෙහි දසත මැඬ
ලෙසින් රළ ගළ සයුළු ගත් හඬ

30. පුර දෙරණත පිරී
කුර රොන් සමඟ ඉතිරී
දිගත ගොස් පැතිරී
පවති හය මිණි කිකිණි ගිගිරී

31. පසඟ තුරු නාදේ
ගජසෙන් කුඤ්ච නාදේ
සමඟ තුති නාදේ
එපුර දිව රෑ එකනි නාදේ

32. එව කව බොරු කියන
තෙපුලෙන් පිරුණු ඇම තැන
උතුරු කුරු දිවයින
වැන්න ඉසුරෙන් එපුර හැම තැන

33. සුරන් පහ සදිසිය
දිලිසත් රුවන් බිතුසිය
සත් දහස් සත්සිය
සතත් රජ මහ පයට ගැවසිය

34. කෙළින පුර වැසියන්
ලොබවන තරම් දෙව්යන්
සව් සිරිනි සැදියන්
සැදිණි එපමණ පොකුණු ගෙවුයන්

35. නිරිඳුන් පෙම් බැඳි
උනුන් වෙත සිත් පැහැදි
ඉදිනෙත් එහි සැදි
බියෙන් මෙන් කිසි දුකෙන් නොවදි

36. රෑ දෙවෙහි නිතොරේ
මිණි පහ පැහැය පැතිරේ
දුරුවන ගණ'ඳු රේ
ලොවැති සව් සිරි සපිරි එපුරේ

**ලිච්ඡවි රජ වැනුම්**

37. සත් සිය දහස් සත්
සත් නරනිඳුහු සම ගොත්
සත් වග කෙරෙහි මෙත්
යුත් ව පවතිත් සිතින් මැදහත්

38. දුසිරිත සිත නැවතී
රද නිති දත් ගුණ ඇති
මැදහත් ලෙස පැවති
එරජ ලිච්ඡවි නිරිඳු නම් ලති

39. කුල දෙටුවන් පැවති
සෙබෙහි තෙදිණින් නොදිලෙති
වෙන් වූ සඳ දිලෙති
රසින් මුසු නුමුසු ගන් සේ වෙති

40. නොබලා වරද තැන්
නො නැමී බසට මහතන්
විලසින් සිය සු තන්
සතන් රකිනුය බලා ඇමතැන්

41. නො මකා කුළසිරිත්
කො තබාම දෙන දන් වත්
නො වඩා අය බදුත්
නැගු සිත් සේම දිය දිය කොත්

42. ගත උන් සබාමය
බස උන්ගේ සබාමය
ඉසුරෙන් සබාමය
සබානම් උන් උන් සබාමය

43. අවා බිය ඇව රූ
සිත් සත් ගුණෙන් සපිරූ
දිගු බිත කිවිය රූ
ඔවුන් ගුණ සිතුයමින් තැවරූ

44. රන් රූ සදි සියභ
දැක දැක නොයන රි සියභ
කන් කළු සුබැ සියභ
ඔවුන් ගුණ සිතුයමින් තැවරූ

45. රුසිරෙන් ලොව ගරූ
අයුරු සුරිඳුන් පිළිරූ
දස රජ දම් දැරූ
ඔවුන් සරිවෙති මෙලොව කවුරූ

46. සක බිම පෙරළෙ මින්
ගැල බඩු නිසල කෙරෙමින්
පවතින මෙන් නොමින්
තුමු දුක් වීදිති සත රකිමින්

47. රොන් ඇරගෙන සෙමින්
යන බිගු ලෙසින් කුසුමින්
ලොවට දුක් නොදෙමින්
ගනිති අය පඬුරු පෙර නියමින්

48. ලුවද සිඳු පෙදෙසේ
දිය නොගෙණම සිටි නැවසේ
දන නොගෙණම තොසේ
සිටිති දනවනි දනනි සිතසේ

49. පල ගත් අතු නසා
පල කන්නවුන් විලසා
දන ගැනුමක් නිසා
දහම් නොනසති දනන් වනසා

50. සවනින් අසන බස
නුවනින් අසව යන ලෙස
කෙරෙති තමා බස
යමක් නොයොදති මිසක් නිසි ලෙස